රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

2020.07.06

නිවේදන අංකය: 229/2020
නිකුත් කළ වේලාව: 15.30

අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කර්තෘ,

**<u>ජාතික විශ්ව විද්‍යාල පද්ධතියට අයත් සියලු විශ්ව විද්‍යාල අද සිට (ජුලි 06) ආරම්භ කිරීමට අවසර ලබා දෙයි</u>**

විශ්ව විද්‍යාලයන්හි සියලුම වෛද්‍ය පීඨවල අවසන් විභාග කටයුතු ජුනි 15 වන දින ආරම්භ කරන ලද අතර එම විභාග පැවැත්වීමේ කාර්යයන් මේ වන විට අවසන් වෙමින් තිබේ.

එමෙන්ම, කොවිඩ් 19 ව්‍යාප්තිය වැළැක්වීම සඳහා වන විශේෂ නිර්ණායක තරයේ පිළිපැදීමට යටත්ව, ජාතික විශ්ව විද්‍යාල පද්ධතියට අයත් සියලු විශ්ව විද්‍යාලවල අධ්‍යයන කටයුතු නැවත ආරම්භ කිරීමට අද සිට (ජුලි 06) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අවසර ලබා දෙන බව එම කොමිෂන් සභාවේ සභාපති මහාචාර්ය සම්පත් අමරතුංග මහතා ප්‍රකාශ කළේය.

**මෙහිදී ඒ ඒ විශ්ව විද්‍යාලයන්හි අධ්‍යයන පීඨයන් සහ එම පීඨයන්ට අදාළ අධ්‍යයන වර්ෂයන් ආරම්භ කරන දින කවරේද යන්න විශ්ව විද්‍යාල උපකුලපතිවරුන් විසින් තීරණය කර වෙන් වෙන් වශයෙන් නිවේදනය කරනු ඇත.**

විශ්ව විද්‍යාල නැවත ආරම්භ කිරීමේදී ජාතික විශ්ව විද්‍යාල පද්ධතියට අයත් සියලු විශ්ව විද්‍යාලය වල අධ්‍යයන හා අනධ්‍යයන කාර්යය මණ්ඩලයන් හා සිසුන් ඇතුලු සියලු පාර්ශ්ව විසින් පහත දැක්වෙන මාර්ගෝපදේශ හා නිර්ණායක පිළිපැදීම අනිවාර්යය වේ.

01. එක් පීඨයකින් එක් වරකට විශ්ව විද්‍යාලයට කැඳවිය හැක්කේ අධ්‍යයන වර්ෂ 02 ක සිසුන් පමණි. මෙහිදී අවසන් වසර හා තුන්වන වසර කැඳවීම වඩා යෝග්‍ය වේ.

02. නේවාසිකාගාර පහසුකම් සැලසීමේදී අනිවාර්යයෙන් එක් සිසුවකුට එක් කාමරයක් බැගින් ලබාදිය යුතුය. විභාග, දේශන ශාලා, පුස්තකාල, විද්‍යාගාර පහසුකම් භාවිතය හා ප්‍රායෝගීය පංති සඳහා සහභාගි වීම ආදී සියලු අධ්‍යයන කාර්යයන්හිදී මීටරයක දුරස්ථභාවය පවත්වා ගැනීම අනිවාර්ය වේ.

03. විශ්ව විද්‍යාල නැවත ආරම්භ කිරීමේදී අධ්‍යයන වාරයන්ට අදාළ දේශන හා ප්‍රායෝගික පංති අවසන් කර සෘජුවම විභාග සඳහා සහභාගි වීමට අපේක්ෂිත සිසුන්ට ප්‍රමුඛතාව ලබාදිය යුතුය.

163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
දු தொ t (+94 11) 2515759
www.news.lk

04. විභාග පැවැත්වීමට පෙර සිදුකරන ඕනෑම අධ්‍යයන කටයුත්තකදී (දේශන හෝ ප්‍රායෝගික පංති වැනි) හැකි කාලය අවම කිරීමට කටයුතු කළ යුතු අතර එහි උපරිමය කුමන හේතුවක් නිසාවත් සති 04කට වැඩි විය යුතු නැත.

05. අවසන් වසර වෛද්‍ය විද්‍යා උපාධිය හදාරන සිසුන්ට (MBBS) සායනික පුහුණුව ආරම්භ කළ හැකිය. ඒ සඳහා අදාළ වෛද්‍ය පීඨ, ශික්ෂණ රෝහල් අධ්‍යක්ෂවරුන්, ක්ෂුද්‍රජීව විද්‍යාඥයින්, මහාචාර්ය ඒකකයන්හි උපදේශකවරුන් හා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ උපදෙස් ලබා ගත යුතුය.

06. එමෙන්ම, දන්ත වෛද්‍ය, ආයුර්වේද වෛද්‍ය අවසන් වසර සිසුන්ට ද (BDS, BAMS, BSMS) ඉහත අනු අංක 05 හි දක්වා ආකාරයටම සිය සායනික පුහුණු කටයුතු ආරම්භ කළ හැක.

07. අධ්‍යයන හා විභාග කටයුතු අවසන් වූ වහාම සිසුන් විශ්ව විද්‍යාලවලින් තම පෞද්ගලික නිවෙස් බලා පිටවිය යුතු අතර, කුමන හේතුවක් මතවත් විශ්ව විද්‍යාලයේ රැඳී නොසිටිය යුතුය.
පස්වරු 7.00 න් පසු විශ්ව විද්‍යාල භූමිය තුළ කවර හේතුවක් නිසාවත් සිසුන්ට රැඳී සිටීමට අවසර නැත.

08. ක්‍රීඩා කටයුතු, සමාජ වැඩ කටයුතු හා ඒ ආකාරයේ කුමන හෝ ඒකාරාශී වීමකට සිසුනට අවසර නොමැත.

09. සිය නේවාසිකාගාරවල ඇති පහසුකම් පිළිබඳව මනා සැලකිල්ලක් යෙදවා වරකට විශ්ව විද්‍යාලයට කැඳවිය යුතු සිසුන් සංඛ්‍යාව පිළිබඳව අධ්‍යයනයකින් පසු අධ්‍යයන කටයුතු ආරම්භ කළ යුතු බවට සියලුම උපකුලපතිවරුන්හට උපදෙස් ලබාදෙනු ලැබේ.

10. උසස් අධ්‍යාපන ආයතන සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද සෞඛ්‍ය විධිවිධාන ඇතුළත් චක්‍රලේඛය තවදුරටත් වලංගු වේ.

11. විශ්ව විද්‍යාලයන්හි කටයුතු කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය කරන අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයන්හි ප්‍රමාණය තීරණය කිරීම සඳහා සියලුම උපකුලපතිවරුන්ට බලය පවරනු ලැබේ.

නාලක කලුවැව
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්